# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2138/27 - 2019 අගෝස්තු මස 28 වැනි බදාදා - 2019.08.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**5 වන සංශෝධනය**

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සේවා ව්‍යවස්ථාව

අංක 1836/6 හා 2013 නොවැම්බර් 11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සහ අංක 1887/21 හා 2014 නොවැම්බර් 05 දිනැති, අංක 1905/07 හා 2015 මාර්තු 09 දිනැති, අංක 2006/53 හා 2017 පෙබරවාරි 17 දිනැති, අංක 2049/14 හා 2017 දෙසැම්බර් 12 දිනැති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍ර මගින් සංශෝධිත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලබන අතර මෙම සංශෝධිත විධිවිධානයන් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණය ගනු ලැබූ 2019 පෙබරවාරි මස 26 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2019 අගෝස්තු මස 07 වන දින.

10.1.1.1

(ii) සේවා ශ්‍රේණියේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හය (06) ක් උපයාගෙන තිබීම.

(vi) අනුමත කාර්ය සාධන ඇගයීම පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

10.2.1

(i) සේවා ශ්‍රේණියේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හය (06) ක් උපයාගෙන තිබීම.

(iii) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

**10.2.1 යටතේ සඳහන් සුදුසුකම් වලට පහළින් පහත සටහන ඇතුළත් කරනු ලැබේ.**

*සටහන*

අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණය ගනු ලැබූ 2019 පෙබරවාරි මස 26 වැනි දිනට II ශ්‍රේණියට උසස්වීමට නියමිත සංශෝධිත 10.1.1.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සහ එදිනට පෙර II ශ්‍රේණියට උසස්වී ඇති නිලධාරීන්, III හා II ශ්‍රේණිවල වසර 12 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහ 10.2.1 (i) හි සඳහන් සුදුසුකම හැර 10.2.1 යටතේ සඳහන් අනෙකුත් සියළුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

09 - 380


1A - G 30844 — 20 (2019/08)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*